**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
பொலிஸ் ஊடகப் பிரிவு
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.10.30 පැය 2125 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1964 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**මුදල් කොල්ලකෑමකට සම්බන්ධ සුරාබදු නිලධාරීන් 05 දෙනෙකු අත්අඩංගුවට - අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.**

2025.06.05 වන දින කොළඹ 11, හෙට්ටිවීදිය ප්‍රදේශයේදී රන් භාණ්ඩ වෙළෙඳසැල් දෙකකින් රුපියල් 102,000,000/= (**දසකෝටි විසි ලක්ෂයක මුදලක්**) කොල්ලකෑම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශය මගින් විමර්ශනයක් සිදුකර 2025.10.30 වන අද දින දහවල් කාලයේ මෙම අපරාධයට සම්බන්ධ සැකකරුවන් 05 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් අවුරුදු 30 ත් 46 ත් අතර වයස්වල පසුවන කොස්ගම, හංවැල්ල, දංකොටුව, මිල්ලෑව හා මඩකලපුව ප්‍රදේශවල පදිංචි සුරාබදු පරීක්ෂකවරයෙකු හා සුරාබදු කෝප්‍රල්වරුන් සිව් දෙනෙකු වේ.**

මෙම සැකකරුවන් විසින් ඉහත රන් භාණ්ඩ වෙළෙඳසැල් දෙකකට නීත්‍යානුකූල වැටලීමක් සිදු කරන ආකාරයෙන් පැමිණ එම වෙළෙඳසැල් වලින් මුදල් රුපියල් දසකෝටි විසි ලක්ෂයක් හා සේවකයින් ඇතුළු පුද්ගලයින් 07 දෙනෙකු අත්අඩංගුවට ගෙන රැගෙන ගොස් එම පුද්ගලයින් 04 දෙනෙකු සන්තකයේ නීති විරෝධී සිගරට් තිබූ බවට මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර අනතුරුව කොල්ලකන මුදලින් රුපියල් කෝටි පහක මුදලක් නැවත ඔවුන්ට ලබා දී ඇති බවටද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

සැකකරුවන් 2025.10.30 වන අද දින කොළඹ ප්‍රධාන ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු හඳුනාගැනීමේ පෙරෙට්ටුවක් සඳහා 2025.11.07 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කර ඇත.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සමූහ මංකොල්ල විමර්ශන අංශය මගින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**